සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved]

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය

ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone

දෙවන වාර ඇගයීම - 2025
**Second Term Evaluation - 2025**

| ශ්‍රේණිය Grade | 11 | විෂයය Subject | ඉතිහාසය - II | කාලය Time | පැය 03 යි 03 hours |
|---|---|---|---|---|---|

නම : - ............................................................ ශ්‍රේණිය :- ..............................

- **I** කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **II** කොටසින් ප්‍රශ්න හතරකට ද **III** කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

01. පහත I යටතේ දක්වා ඇති ස්ථාන සියල්ලම සපයා ඇති ලංකා සිතියමෙහි ද II යටතේ දක්වා ඇති ස්ථාන සියල්ලටම සපයා ඇති ලෝක සිතියමෙහි ද ලකුණු කර නම් කරන්න.

(අ) I. කිරිදිඔය, දැදුරු ඔය, නාච්චදුව වැව, පදවිය වැව, ගම්පොල, මාතලේ, පොම්පරිප්පු, සීගිරිය, නල්ලූර්, ලංකාපටුන, බුන්දල, කල්පිටිය (ලකුණු 12)

II. ඕලන්දය, වැනිසිය, බොම්බාය, ජාවා, පර්සියන් බොක්ක, පිලිපීන් දූපත් (ලකුණු 06)

(ආ) (i) පහත A, B, C, D යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අනුපිළිවෙළින් සඳහන් කරන්න.

A - සමන්තපාසාදිකාවේ කතුවරයා
B - ඉංග්‍රීසින් මුහුදුබඩ ප්‍රදේශවල බලය තහවුරු කරගන්නා විට උඩරට පාලකයා
C - ධම්මාලංකාර සිරි සුමන තිස්ස හිමියන්ගේ මූලිකත්වයෙන් ගාල්ලේ ආරම්භ වූ බෞද්ධ මුද්‍රණාලය
D - ප්‍රතිසංස්කරණවල අවශ්‍යතාවය පෙන්වා දෙමින් ප්‍රථමවරට විධිමත් පෙත්සමක් යටත් විජිත ලේකම් වෙත ඉදිරිපත් කළ ලාංකිකයා (ලකුණු 04)

- පහත A , B පින්තූර අධ්‍යනය කර අසා ඇති ප්‍රශ්නවලට අනුපිළිවෙළින් පිළිතුරු ලියන්න.

**A රූපය**



(ii) (1) මෙම මූර්තිය නම් කරන්න.
(2) මෙය පිහිටි නගරය ලියන්න.
(3) මූර්තිය නිර්මාණය කළ කාලය ලියන්න.
(4) මෙම මූර්තියෙන් නිරූපණය කරන දෙවි කෙනෙකු ලියා දක්වන්න.
(ලකුණු 04)

**B රූපය**



(iii) (1) මෙම පින්තූරයෙන් දැක්වෙන පුද්ගලයා නම් කරන්න.
(2) ඔහු කුමන ආගමික පුනර්ජීවනයක් වෙනුවෙන් කටයුතු කරන ලද්දේ ද?
(3) මෙතුමාගේ මග පෙන්වීම මත බිහි වූ පුවත්පතක් නම් කරන්න.
(4) දෙමළ සිසුන්ගේ ඉංග්‍රීසි අධ්‍යාපනය දියුණු කිරීම සඳහා ආරම්භ කළ පාසල නම් කරන්න.
(ලකුණු 04)

## II කොටස

02. (i) පහත ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් සිදුවීම් හා සම්බන්ධ ස්ථාන ABC පිළිවෙළින් ලියා දක්වන්න.

A - මිහිදන් කළ මළ සිරුරු 30 ක් හමු වීම.
B - මළ සිරුර නමා වකුටු කොට වැළලීම.
C - පුළුස්සා අනුභව කළ කැලෑ දෙල් ඇට හමුවීම. (ලකුණු 03)

(ii) A - ප්‍රාග් ඓතිහාසික යුගයේ ගල් මෙවලම් සෑදීම සඳහා භාවිතා කළ ගල් වර්ග දෙකක් නම් කරන්න.
B - ගල් මෙවලම් වලින් සිදුකරගත් කාර්යයන් දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) පූර්ව ඓතිහාසික යුගය ප්‍රාග් ඓතිහාසික යුගයෙන් වෙන් වන කරුණු දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස වල ව්‍යුහය හා ස්වරූපය කරුණු තුනක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06)

03. (i) පහත ABC සිද්ධීන් හා සම්බන්ධ පුද්ගලයින් හෝ රජවරු නම් කරන්න.

A - යාපනයේ පියංගුක තිස්ස විහාරය ඉදිකිරීම
B - උණ රෝගීන් සඳහා උපසංගරෝගනාසා නමින් රෝහලක් ඉදිකිරීම.
C - පන්සලක ප්‍රධාන භික්ෂුව යටතේ සිටි ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා (ලකුණු 03)

(ii) පහත ABCD ප්‍රශ්න වලට පිළිතුරු පිළිවෙළින් ලියන්න.

A - බදුලු ටැම් ලිපිය මතින් නීති පනවන ලද වෙළෙඳපොළ නම් කරන්න.
B - බුත්සරණ කෘතියේ හේන හඳුන්වා ඇත්තේ කුමන නමකින් ද?
C - මජ්ජිම නම් කම්මල්කරුවෙක් පිළිබඳ තොරතුරු සඳහන් වන සෙල්ලිපිය කුමක් ද?
D - අතීතයේ නීතිය හා සම්බන්ධ නීති විශාරදයන් හඳුන්වා ඇත්තේ කුමන නමකින් ද? (ලකුණු 04)

(iii) පැරණි සමාජය තුළ බුදු දහමට සමගාමීව වෙනස් ආගම් පැවති බව කරුණු දෙකක් ඇසුරෙන් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) අතීත ශ්‍රී ලංකාව බහු සංස්කෘතික ජන සමාජයක් වුවත් ඉතා සහයෝගයෙන් කටයුතු කර ඇති බවට කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

04. (i) A - කෙටි දුර මැනීම සඳහා භාවිතා කළ මිනුමක්
B - අවකාශය මැනීම සඳහා භාවිතා කළ මිනුම් දෙකක් නම් කරන්න. (ලකුණු 03)

(ii) වැවේ පහත සඳහන් අංගවලින් ඉටුවන කාර්යයන් එක බැගින් a, b, c, d අනුපිළිවෙළින් ලියන්න.
a - රළපනාව        b - වැව් බැම්ම
c - බිසෝ කොටුව        d - පිටවාන (ලකුණු 04)

(iii) අතීතයේ යකඩ නිසාරණය සිදු වූ බවට සාක්ෂි හමුවන ස්ථාන දෙකක් නම් කර එක් ස්ථානයක එම කාර්ය සිදු වූ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) අතීත ශ්‍රී ලංකාව තුළ දියුණු වාස්තු විද්‍යාවක් පැවැති බව උදාහරණ තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

05. (i) මහනුවර රාජධානියේ ආරක්ෂාව හා සම්බන්ධ වූ

A - ගංගාවක්

B - දුර්ග මාර්ගයක්

C - කඳුවැටියක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පළමුවන විමලධර්මසූරිය රජතුමා මුහුණ දුන් අභියෝග දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) මහනුවර රාජධානිය තුළ ආර්ථික කටයුතු සංවිධානයේ වී තිබූ ආකාරය කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) මහනුවර රාජධානියේ සමාජ සංවිධානය තුළ හඳුනාගත හැකි කැපී පෙනෙන ලක්ෂණ තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

06. (i) ABC සිදුවීම් වලට අදාළ පුද්ගලයන් පිළිවෙළින් නම් කරන්න.

A - 1865 ලංකා සංගමය පිහිටුවීමට නායකත්වය දුන් යුරෝපීය ජාතිකයා

B - ඡන්ද බලයෙන් ව්‍යවස්ථාදායක සභාවට තේරී පත් වූ ප්‍රථම උගත් ලාංකිකයා

C - 1919 දී ආරම්භ වූ ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපතිවරයා (ලකුණු 03)

(ii) පහත සඳහන් ප්‍රතිසංස්කරණ ආරම්භ වූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ABCD පිළිවෙළින් ලියා දක්වන්න.

A - සීමිත ඡන්ද බලයක් හඳුන්වා දීම.

B - රට පළාත් පහකට බෙදීම.

C - රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම.

D - අග්‍රාණ්ඩුකාර ධුරය හඳුන්වා දීම. (ලකුණු 04)

(iii) 1833 වර්ෂයේ දී ලංකාවට හඳුන්වා දුන් කෝල්බෲක් යෝජනාවන්ගේ යහපත් බලපෑමක් හා අයහපත් බලපෑමක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යෝජනා තුනක් විස්තර කරන්න. (ලකුණු 06)

07. (i) පහත සිදුවීම් හා සම්බන්ධ පුද්ගලයින් ABC අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - ප්‍රථමවතාව ලූල් කඳුරු වතුයායේ තේ වගාව අත්හදා බැලීම සිදුකළ පුද්ගලයා

B - කෝපි වලින් අයකළ අපනයන බද්ද අඩුකළ ආණ්ඩුකාරවරයා

C - වතු කම්කරුවන් වෙනුවෙන් නායකත්වය ගත් පුද්ගලයා නම් කරන්න. (ලකුණු 03)

(ii) ශ්‍රී ලංකාවේ තේ වගාවේ උන්නතියට බලපෑ හේතු දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) කෝපි වගාවේ ව්‍යාප්තියට හා පරිහානියට බලපෑ හේතුව බැගින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) බ්‍රිතාන්‍ය පාලනයේ බලපෑම නිසා මෙරට ඇති වූ සමාජ හා සංස්කෘතික වෙනස්වීම් තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

## III කොටස

08. (i) පුනරුද සමයේ පහත සිදුවීම් හා සම්බන්ධ පුද්ගලයන් අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - ග්‍රහලෝක සූර්යයා වටා ඉලිප්සාකාරව ගමන් ගන්නා බව සොයා ගැනීම.
B - අවසාන විනිශ්චය චිත්‍ර ඇඳීම.
C - මුද්‍රණ යන්ත්‍රය සොයා ගැනීම (ලකුණු 03)

(ii) a. පුනරුදයේ බලපෑම නිසා නව පණක් ලැබූ භාෂාවන් දෙක හා

b. පුනරුද සමයේ ඉතාලියේ බිහි වූ ගත්කතුවරු දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 04)

(iii) යුරෝපයේ පුනරුදයක් ඇති වීමට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) දේශගවේෂණ ව්‍යාපාරය සාර්ථක වීමට බලපෑ හේතු තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

09. (i) කාර්මික විප්ලව සමයේ පහත සඳහන් නිර්මාණ සොයාගත් පුද්ගලයින් නම් කරන්න.

A - ජෙනී යන්ත්‍රය
B - යපස් උණු කිරීමේ විදුලි උදුන
C - දුම් බෝට්ටුව (ලකුණු 03)

(ii) බ්‍රිතාන්‍ය හැරුණු විට යුරෝපයේ සෙසු රටවල කාර්මික විප්ලවය ව්‍යාප්තියට බලපෑ හේතු දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) කාර්මික විල්පවය නිසා ඇති වූ යහපත් හා අයහපත් ප්‍රතිඵලය බැගින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) බ්‍රිතාන්‍යයේ ගල් අඟුරු කර්මාන්තයේ උන්නතියට හේතු වූ කරුණු තුනක් විස්තර කරන්න. (ලකුණු 06)